සියලු ම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂයය Subject: ව්‍යාපාර අධ්‍යයනය II | කාලය Time: පැය 03 |

**උපදෙස්**

- **එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## I කොටස

**01.** තරිඳු තම ප්‍රදේශයෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන පාසැල් ළමුන් සඳහා පිටිකළ කොළකැඳ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම කොළකැඳ මිශ්‍රණ පැකැට්ටු විකිණීම සඳහා ප්‍රසිද්ධ පාසැලක් අසල අලෙවි සැලක්ද ඔහු විසින් පවත්වාගෙන යයි.

I (අ). මෙම සිද්ධියේ සඳහන් ද්විතියික නිෂ්පාදනය හා තෘතීයික නිෂ්පාදනය පැහැදිලි කරන්න. (ල. 2)

(ආ). ලාභ උපරිම කිරීමට අමතරව ව්‍යාපාරයකට තවත් අරමුණු පැවතිය හැකිය. එවැනි අරමුණු 4 ක් පැහැදිලි කරන්න. (ල. 2)

II මෙම කොළ කැඳ වල ප්‍රමිතිය සම්බන්ධයෙන් දෙමාපියන් කළ පැමිණිල්ලකට අනුව පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය විසින් මෙම ව්‍යාපාරය වසා දැමීමට තීරණය කරන ලදී.

(අ). තරිඳුගේ මෙම ව්‍යාපාරය කෙරෙහි බලපෑම් එල්ලකරන ලද සාර්ව බලවේගය නම් කරන්න. (ල. 2)

(ආ). මෙවැනි ව්‍යාපාරවලට එල්ලවිය හැකි තර්ජන වලට මුහුණදීම සඳහා තරිඳු වැනි ව්‍යාපාරිකයන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග 2 ක් ලියන්න. (ල. 2)

III තරිඳුගේ ව්‍යාපාරයේ යෙදවුම්/නිමැවුම් ක්‍රියාවලිය රූප සටහනක් මගින් පෙන්වන්න. (ල. 4)

IV (අ). විද්‍යුත් වානිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යන සංකල්ප පැහැදිලි කරන්න. (ල. 2)

(ආ). බොහෝ විට සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි බලපෑම් ඇතිකිරීම තුළින් ව්‍යාපාර කෙරෙහි අවස්ථා හා තර්ජන මතු කරයි. නිදසුනක් මගින් පැහැදිලි කරන්න.

(ල. 2)

V ව්‍යාපාර සාර්ථක වීමට නම් තම පරිසරය පිළිබඳ අධ්‍යයනය කළ යුතුය. එසේ පරිසර විශ්ලේෂණයක් කිරීමේදී ව්‍යාපාර ශදු අත විශ්ලේෂණයක් යොදාගනු ලබයි. එවැනි ශදු අත විශ්ලේෂණයකින් ව්‍යාපාරයකට ලැබිය හැකි ප්‍රයෝජන 4 ක් ලියන්න. (ල. 4)

(මුළු ල. 20)

**02.** රත්‍රුපස්වල ප්‍රදේශයේ පිහිටි ග්ලවුස් සමාගමක් විසින් අපරීක්ෂාකාරී ලෙස බැහැර කරන ලද කසල නිසා ප්‍රදේශයේ පානීය ජලයට විශාල අහිතකර බලපෑමක් ඇති විය.

I (අ). ප්‍රදේශවාසියකු ලෙස ඔබට කසල කළමනාකරණයට දායක විය හැකි ආකාර 4 ක් සඳහන් කරන්න. (ල. 2)

(ආ). වෙළඳපොල ස්ථානය හා වෙළඳපොල අවකාශය අතර ඇති සමානකම් හා අසමානකම් දෙක බැගින් ලියන්න. (ල. 2)

II සමාජය තුළ ව්‍යාපාර විසින් වැදගත් භූමිකාවන් කිහිපයක් ඉටුකරනු ලැබේ.

(අ). කාර්මික විප්ලවය හේතුකොටගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න. (ල. 2)

(ආ). ශ්‍රී ලංකාවේ පැරණි ආර්ථික ක්‍රියාවලිය තුළ කෘෂිකර්මාන්තය මූලික වුවද වර්තමානයේ කෘෂිකර්මාන්තයට අමතරව විවිධ වූ අංශ වෙත නැඹුරුවීමට බලපාන හේතු 4 ක් සඳහන් කරන්න. (ල. 2)

III වර්තමානයේ ව්‍යාපාර සමාජ වගකීම් ඉටුකිරීම කෙරෙහි වැඩි උනන්දුවක් දක්වයි.

(අ). ව්‍යාපාර විසින් සේවකයන්ට සමාජ වගකීම් ඉටුකරන ආකාර 4 ක් පැහැදිලි කරන්න. (ල. 2)

(ආ). එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සමාජ වගකීම් ලෙස ප්‍රමුඛතාවය ලබාදිය යුතු අංශ හතරක් දක්වා ඇත. එම අංශ 4 නම් කරන්න. (ල. 2)

IV (අ). ''සියලුම පාර්ශවයන්ගේ අපේක්ෂා ඉටුවන ආකාරයට සමාජීය වගකීම් ඉටු කිරීමට පෙළඹිය යුතුය.'' නිදසුනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ල. 2)

(ආ). සමාජීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට විවිධ ප්‍රතිලාභ අත් වේ. එවැනි ප්‍රතිලාභ 4 ක් සඳහන් කරන්න. (ල. 2)

V (අ). ව්‍යාපාර ආචාර ධර්ම යනුවෙන් කුමක් අදහස් වේද ? (ල. 2)

(ආ). ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ව්‍යාපාර වලට වැදගත් වන්නේ ඇයි දැයි කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 2)

(මුළු ල. 20)

**03.**

I (අ). ව්‍යාපාරයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් ලියන්න. (ල. 2)

(ආ). ''ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමට බදු නොවන ආදායම් වලින් ද සැලකිය යුතු ප්‍රමාණයක් දායක වේ.'' බදු නොවන ආදායම් වර්ග 4 ක් සඳහන් කරන්න. (ල. 2)

II (අ). ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු 2 ක් දක්වන්න. (ල. 2)

(ආ). ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන ව්‍යාපාර සංවර්ධනය සඳහා කටයුතු කරන ආකාර 4 ක් සඳහන් කරන්න. (ල. 2)

III (අ). පාරිභෝගිකයාට වෙළඳපොළ තුළ ව්‍යාපාරිකයන්ගෙන් සිදුවිය හැකි වෙළඳ විෂමාචාර සඳහා නිදසුන් 4 ක් ලියන්න. (ල. 2)

(ආ). SLS සහතිකය අනිවාර්යයෙන්ම ලබාගතයුතු යැයි පාරිභෝගික ආරක්ෂණ අධිකාරී පනත මගින් නියම කර ඇති භාණ්ඩ වර්ග 4 ක් ලියන්න. (ල. 2)

IV (අ). රජයක් විසින් ඉටුකර ගැනීමට කටයුතු කරන ආර්ථික අරමුණු 4 ක් නම් කරන්න.(ල. 2)

(ආ). රජයක් විසින් ව්‍යාපාර වලින් විවිධ බදු අය කරමින් ව්‍යාපාර කෙරෙහි බලපෑම් සිදු කරමින් කටයුතු කරයි. රජය බදු අය කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන 4 ක් සඳහන් කරන්න.

(ල. 2)

V ඔබ දන්නා ව්‍යාපාර ආයතනයක් උදාහරණයට ගෙන එම ආයතනය සමාජ වගකීම් සංකල්පයට කෙසේ දායකවන්නේ දැයි පැහැදිලි කරන්න. (ල. 4)

(මුළු ල. 20)

**04.**

I රජය ව්‍යාපාර වලට මැදිහත්වන විවිධ ආකාර 4 ක් නම්කර නිදසුන බැගින් ලියන්න. (ල. 4)

II ''රජයත් ව්‍යාපාරත් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් ගොඩනැගීම අවශ්‍ය වේ.'' පැහැදිලි කරන්න.

(ල. 4)

III (අ). ''පාරිභෝගික ආරක්ෂණය මෑත කාලයේ අතීතයටත් වඩා අවශ්‍ය වේ.'' එසේ වීමට බලපා ඇති හේතු 4 ක් ලියන්න. (ල. 2)

(ආ). පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට අත්වන වාසි දෙක බැගින් ලියන්න. (ල. 2)

IV අමිත් විසින් තම ප්‍රදේශයෙන් එකතු කරගන්නා ලද අන්නාසි සහ ගස්ලබු මැදපෙරදිග රටවලට අලෙවිකිරීමේ ආයතනයක් Fresh Fruits නමින් පවත්වාගෙන යයි.

(අ). මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද ? (ල. 2)

(ආ). එම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අදාල නීතිමය තත්ත්වය හා පනත කුමක්ද ? (ල. 2)

V (අ). මෙම ව්‍යාපාරය සී/ස පෞද්ගලික සමාගමක් බවට පත්කළ යුතු යයි අමිත් මහතා පවසයි. එම සමාගම් වර්ගයට අදාල වන ලක්ෂණ 4 ක් නම් කරන්න. (ල. 2)

(ආ). මෙම සමාගම ලියාපදිංචියට අදාල වන පනත හා යා යුත්තේ කිනම් ආයතනයට ද ?(ල. 2)

(මුළු ල. 20)

## II කොටස

**05.**

I ''පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල ප්‍රධාන අරමුණ ලාභ ඉපැයීමයි'' ලාභය එතරම් වැදගත් වීමට හේතු හතරක් පෙන්වා දෙන්න. (ල. 4)

II නලින්, කවීන් හා සවින් යන අයගේ මුදල් ආයෝජනයෙන් සීමිත පෞද්ගලික සමාගමක් පවත්වාගෙන යයි. තම ව්‍යාපාරය සීමාසහිත නිල ලැයිස්තුගත සමාගමක් බවට පත් කර ගැනීමට සාකච්ඡාවකින් පසුව තීරණයක් ගත් අතර එය ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරමින් පවතී.

(අ). මෙම පරිවර්තනය සිදු කිරීමට නම් පවතින සමාගමේ ඇතිවිය යුතු මූලික වෙනස්කම් කෙටියෙන් දක්වන්න. (ල. 2)

(ආ). සීමාසහිත නිල ලැයිස්තුගත සමාගමක් බවට පරිවර්ථනය වුවහොත් එහි කොටස් හිමියන්ට ලැබිය හැකි වාසි හා අවාසි දෙක බැගින් ලියන්න. (ල. 2)

III (අ). 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුව සංස්ථාපිත සමාගම් වර්ග කල හැකි ආකාර ගැලීම් සටහනක් ඇසුරෙන් ඉදිරිපත් කරන්න. (ල. 2)

(ආ). සංස්ථාපිත සමාගම් සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමි වී ඇති බලතල 4 ක් සඳහන් කරන්න. (ල. 2)

IV 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ දක්වා ඇති පරිදි සීමාසහිත පොදු සමාගමක අවම කොටස්කරුවන් සංඛ්‍යාව 01 කි. එහෙත් එම පනතේ දක්වන පරිදි අධ්‍යක්ෂවරු අවමය දෙදෙනෙකු සිටිය යුතු බව දක්වයි. මෙහිදී සමාගම ක්‍රියාකරන ආකාරය පිළිබඳ අදහස් දක්වන්න.

(ල. 4)

V සමන් මුණසිංහ කුඩා ආපනශාලාවක් පවත්වාගෙන යන කේවල ස්වාමී ව්‍යාපාරිකයෙකි. ව්‍යාපාරයේ නිෂ්පාදන සඳහා ''මුළුතැන්ගෙය රස'' ලෙස නම යොදා ප්‍රසිද්ධ කිරීමට අදහස් කරයි. ඒ සඳහා ඔහු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය පැහැදිලි කරන්න. (ල. 4)

(මුළු ල. 20)

**06.**

I ඉන්ද්‍රජිත් සිය ව්‍යාපාරය මෙහෙයවයි. නිතරම නව ව්‍යාපාර අවස්ථා දකිමින් ඒවා ග්‍රහණය කර ගනිමින් මූල්‍ය අවදානම් සහිත කටයුතු අත්හදා බලයි. ව්‍යාපාර පැවැත්මට අදාළ තීරණ ගනී. ව්‍යාපාර කටයුතු ඉතා නම්‍යශීලීව කරගෙන යයි. මූල්‍ය, අලෙවි මෙන්ම භෞතික සම්පත්ද මනා ලෙස කළමනාකරණය කරයි. සිය ව්‍යාපාරයේ සේවකයින්ගේ අනාගතය සුරක්ෂිත කිරීමට හැකි සියලු වෙර දරයි. නිමල් තුළ පවත්නා ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 04 ක් නම් කරන්න. (ල. 2)

II පහතින් දක්වා ඇත්තේ ව්‍යාපාර ආයතන කිහිපයක නමය.

- සීමාසහිත ජය ලලිතා (පෞද්ගලික) සමාගම
- මනුල හාඩ්වෙයාර්
- සී/ස කිරිදිවැල සමාගම පී.එල්.සී.
- සමන් සහ සමාගම

✷ සී/ස කුරුප්පු සමාගම

(අ). ඉහත ව්‍යාපාර එක් එක් ව්‍යාපාර සංවිධාන වර්ගය යටතේ වර්ග කරන්න. (ල. 2)

(ආ). ඉහත ව්‍යාපාර වල උපරිම හා අවම සාමාජික සංඛ්‍යාව දක්වන්න. (ල. 2)

(ඉ). නෛතික පුද්ගලභාවයක් හා සීමිගත වගකීමක් ඇති නැති වශයෙන් බෙදා දක්වන්න. (ල. 2)

III (අ). සමූපකාර සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කලයුතු ලියවිලි මොනවාද ?(ල. 3)

(ආ). එවැන්නක් සඳහා ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ කා වෙතද ? (ල. 1)

IV ශ්‍රී ලංකාවේ විශාල ලෙස කුඩා ව්‍යාපාර ආරම්භ වුවද වසර පහක් ගතවන්නටත් පෙර බොහොමයක් ව්‍යාපාර වැසී යන බව පර්යේෂකයෝ පෙන්වා දෙති.

(අ). කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන කරුණු හතරක් ඉදිරිපත් කරන්න. (ල. 2)

(ආ). කුඩා ව්‍යාපාර වලට මූල්‍ය පහසුකම් සැපයීම සඳහා දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන යෝජනා ක්‍රම 4 ක් නම් කරන්න. (ල. 2)

V (අ). පරාටේ නීතිය යනු කුමක්ද ? කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2)

(ආ). ශ්‍රී ලංකාවේ මිල ස්ථායීතාව තිරසාර ලෙස සහතික කිරීම සඳහා මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීමට හා මූල්‍ය ප්‍රතිපත්ති රාමුව වැඩි දියුණු කිරීමට විධි විධාන ඇතුලත් කරමින් සම්මත කරගත් වර්තමානයේ ක්‍රියාත්මක වන මහ බැංකු පනත කුමක්ද?

(ල. 2)

(මුළු ල. 20)

**07.**

I හවුල් ව්‍යාපාර සම්බන්ධව බලපාන විවිධ නීති මූලාශ්‍ර හා ඊට අදාළ කරුණු ලියන්න. (ල. 4)

II (අ). බහු ජාතික සමාගම් යන්න හඳුන්වන්න. (ල. 2)

(ආ). බහු ජාතික සමාගම් වල ප්‍රධාන ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 2)

III රාජ්‍ය සංස්ථා ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපාර ක්ෂේත්‍ර 4 ක් නම් කර ඒවාට උදාහරණ දෙක බැගින් ලියන්න. (ල. 4)

IV පහත නිර්ණායක මත රාජ්‍ය දෙපාර්තමේන්තු හා රාජ්‍ය සමාගම් සන්සන්දනය කරන්න.

නිර්ණායක - සාමාජිකත්වය
ප්‍රාග්ධනය බෙදීම.
කළමනාකරණය
වගකීම
නෛතික පුද්ගලභාවය
ලියාපදිංචිය/සංස්ථාපනය
ගිණුම් තැබීම හා විගණනය
ලාභාලාභ බෙදීම. (ල. 4)

V (අ). ව්‍යාපාර සංයෝජන වන ආකාර මොනවාද ? (ල. 2)

(ආ). එම ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2)

(මුළු ල. 20)

**08.**

I (අ). වර්තමානයේ ව්‍යවසායකත්වයේ ප්‍රවණතාවයකි කාන්තා ව්‍යවසායකත්වය. ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකත්වය ඉහළ යාමට බලපෑ හේතු 4 ක් සඳහන් කරන්න. (ල. 2)

(ආ). කාන්තා ව්‍යවසායකත්වය මුහුණ දෙන අභියෝග 4 ක් ලියන්න. (ල. 2)

II සෑම කළමනාකරුවෙක්ම ව්‍යවසායකයෙකු ලෙස සැලකිය නොහැක. ව්‍යවසායකයා හා කළමනාකරු අතර වෙනස්කම් 4 ක් ලියන්න. (ල. 4)

III (අ). නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය (creativity and Innovation) යන්න හඳුන්වන්න. (ල. 2)

(ආ). නවෝත්පාදනය යටතට අයත් දෑ 4 ක් නම් කරන්න. (ල. 2)

IV (අ). මුදල් විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීමෙන් ව්‍යාපාරිකයෙකු ලබන වාසි/වැදගත්කම් 4 ක් ලියන්න. (ල. 2)

(ආ). ආසන්න මුදල් (near money) හා බැංකු මුදල් (Bank money) වෙන වෙනම හඳුන්වන්න. (ල. 2)

V පහත සංකල්ප කෙටියෙන් හඳුන්වන්න.

- ඒකක භාර
- ආයෝජන කළඹ
- ව්‍යාපාර බැංකු හෙවත් වණික් බැංකු
- ප්‍රාථමික අලෙවිකරුවන් (ල. 4)

(මුළු ල. 20)